# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/GPS/130/9/13
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.06.04

අයවැය චක්‍රලේඛ අංක : 159

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්,

**<u>රජයේ ආයතන සඳහා නිල වාහන සැපයීම</u>**

2013 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත, මීළඟ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සහභාගිවන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ ප්‍රවාහන පහසුකම් සැලැසීමේ දී රජයේ අමාත්‍යාංශ සහ ආයතනවල දැනට පවතින ප්‍රවාහන පහසුකම් උපරිම ලෙස යොදා ගැනීමටත්, දැනට පවතින රජයේ වාහන යොදා ගැනීමට නොහැකි අවස්ථාවලදී පමණක් පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය සඳහන් කරන ප්‍රමිතියෙන් යුත් වාහන මිලදී ගැනීමටත් තීරණය කර ඇත. අනෙකුත් සියළුම වාහන අයවැය චක්‍රලේඛ අංක 150 අනුව මිලදී ගැනීමට සහ සමුළුව අවසන් වූ වහාම එම වාහන අදාළ ආයතන වෙත අනුයුක්ත කිරීමටත් කටයුතු සූදානම් කර ඇත.

02. ඒ අනුව, මේ වන විට අමාත්‍යාංශ ලේකම්වරුන් සහ සියළු ආයතන ප්‍රධානීන් විසින් ඔවුන්ගේ ආයතනයන්හි දැනට ඇති වාහන පිළිබඳ විස්තර, එනම්, මේ වනවිට නිලධාරීන්ට අනුයුක්ත කර ඇති වාහන ද ඇතුලත්ව, එම වාහනවල නිෂ්පාදිත වර්ෂය, ලියාපදිංචි අංකය සහ ධාවන තත්වය ආදී විස්තර 2013 ජුනි 30 වැනි දින හෝ ඊට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එසේම, මෙම පහසුකම් සැලසීම සඳහා සලකා බැලීමට අමාත්‍යාංශ, ආයතන, සංස්ථා සහ ව්‍යාපෘති විසින් මේ වනවිට ඇණවුම් කර ඇති නව වාහන පිළිබඳ විස්තර ද මහා භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලෙස උපදෙස් දෙනු ලැබේ.

03. මෙම වර්ෂයේ දී සහ ලබන වර්ෂයේ දී රජය විසින් මිළ දී ගැනීමට නියමිත වාහන පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුළුවේ ප්‍රවාහන අවශ්‍යතාවයන් සමග මැනවින් සම්බන්ධීකරණය කළයුතු බැවින්, අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය වාහන 2013 නොවැම්බර් මස අවසන් වන තෙක් මිළ දී ගැනීමේ හා බෙදා හැරීමේ කටයුතු තාවකාලිකව නතර කරනු ලැබේ. විවිධ විදේශ මූල්‍යය සහායයන් යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා මිල දී ගැනීමට අපේක්ෂිත නව වාහන මිල දී ගැනීම්

ද මේ සමග අන්තර්ගතවන අතර, එම අවශ්‍යතාවයන් ද මෙම වැඩපිළිවෙළ තුළින්ම පසුව සපුරා ලීමට කටයුතු කරනු ලැබේ. මෙම වැදගත් අන්තර්ජාතික සමුළුවේ දී වාහන සඳහා වන පිරිවැය, ඉහත වැඩපිළිවෙල තුළින් අවම පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමට මහා භාණ්ඩාගාරයට හැකිවනු ඇත.

අත්සන් කලේ : පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති